**ශීර්ෂය - 270 අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුලි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය හා අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් ලැබීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද රු.522,734 ක් වෙනත් ආදායම් ශීර්ෂය යටතේ (2006-0-2-0-20) රු.218,830 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2020 මෙවැනි වැරදි ආදායම් ශීර්ෂයට සටහන් නොකර අදාළ ආදායම් ශීර්ෂයට තබන ලෙස අදාළ ප්‍රා.ලේ.කාර්යාවල නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට පෙර සියලු ආදායම් අදාළ ආදායම් ශීර්ෂයට සටහන් කර ඇත්දැයි බලා නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

### 1.6.2 පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අම්පාර නගර සභාවට ගෙවිය යුතු වරිපනම් හා බදු රු.245,914 ක් මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සටහන (iii) හි දක්වා නොතිබුණි. | විෂයභාර නිලධාරියාට නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට උපදෙස් ලබා දී ඇත. | ගෙවිය යුතු වරිපනම් හා බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශයේ බැරකම් ප්‍රකාශයේ පෙන්වීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක නිලධාරීන් තුන්දෙනෙකුගෙන් අයවිය යුතු රු.776,750 ක ණය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 දේපල පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් භාවිතා කරනු ලබන කාර්යාල ගොඩනැගිලි 32 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ගොඩනැගිලිවලට අදාළ තක්සේරු වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබා දී නැත. සිහිකැඳවීම්කර ඇත. ලද වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | කාර්යාල ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ආ) මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | විදුලි උපකරණ ලේඛනය මු.රෙ. ප්‍රකාරව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව සියළුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |
| (ඇ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | හානි පිළිබඳ ලේඛනය මු.රෙ. ප්‍රකාරව පවත්වාගෙන යන අතර යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඈ) මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | බැරකම් පිළිබඳ ලේඛනය මු.රෙ. ප්‍රකාරව පවත්වාගෙන යාමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි අනුව බැරකම් ලේඛනයක බැරකම් සටහන් කළ යුතුය. |

### 1.6.6 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම නොවන වත්කම් ප්‍රකාශය ඒ.සී.ඒ.-6 හි දක්වා තිබූ 2020.01.01 දිනට ආරම්භක ශේෂය සංශෝධනය කිරීම මත වත්කම්වල වටිනාකමට එකතු වූ රු.35,949,298 ක් පිළිබඳ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී ආරම්භක ශේෂ සඳහා ප්‍රකාශයන් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. | මූල්‍ය ප්‍රකාශන සමග ආරම්භක ශේෂ සංශෝධනයට අදාළ සැසඳුම් ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා ගෙවීම් සිදු කිරීම සඳහා රු.5,804,101,000 ක් වූ අග්‍රිම ඉල්ලීම් කර තිබුණත් රු.4,737,886,844 ක් වූ අග්‍රිම පමණක් ලැබී තිබුණි. ඒ අනුව ඉල්ලීම් සිදු කළ අග්‍රිම ප්‍රමාණය සහ ලැබූ අග්‍රිම අතර වෙනස රු.1,066,214,156 ක් විය. | ලැබුණු අග්‍රිම මුදල වන රු.4,737,886,844 ට පමණක් වැඩ සිදුකර ඇත. | අග්‍රිම කළමනාකරණය ගැන සැලකිලිමත් විය යුතු බව. |

### 2.2 තැන්පතු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආලෙයියඩිවේම්බු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂවල ගෙවිය යුතු මත්පැන් අලෙවිහල් බලපත්‍ර ගාස්තු රු.2,455,800 ක් අදාල දෙපාර්තමේන්තුවට යැවීමට ක්‍රියාමාර්ග නොගෙන තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. | ආලයාඩිවෙම්බු ප්‍රා.ලේ.කා. විසින් මේ වන විට අදාළ වටිනාකමින් රු.1,091,800 ක් ගෙවා ඇති අතර, ඉතිරි මුදල අග්‍රිම මුදල ලබා ගන්නා විටදී ඉතා කඩිනමින් යොමු කරන බව දන්වා ඇත. | රැස් කරනු ලැබූ මත්පැන් අලෙවිහල් බලපත්‍ර ගාස්තු අදාල දෙපාර්තමේන්තුව වෙත නියමිත කාලය තුළ යැවීමට කටයුතු කළ යුතුය. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසි සමඟ සම්බන්ධතාවය** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 23:18 වැනි වගන්තිය xii පරිච්ඡේදය | නිලධාරීන් දිවයිනට පිටත ගත කරනු ලබන නිවාඩු සම්බන්ධයෙන් වාර්තාවක් සකස්කර දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිලධාරීන් ප්‍රදේශයෙන් බැහැරව ගත කරන නිවාඩු (විදේශ නිවාඩු සම්බන්ධ වාර්තාව ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.1 ඡේදයේ 3.5 දරන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සියයට 5කට වැඩි මූලධන වියදම් ඉතිරි කිරීම් 03 ක් සම්බන්ධයෙන් විධිමත් හේතු දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**2.4 අධිභාර කිරීම්**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අංක 08/2017 දරන 2017 මාර්තු 29 දිනැති දිවිනැගුම චක්‍රලේඛය සහ අංක ඩීඑස්ඩී/එච්ඕ/එස්ඩබ්ලිව්/14/16 දරන 2019 සැප්තැම්බර් 10 දිනැති සංශෝධිත චක්‍රලේඛය ප්‍රකාරව, පවුලේ සාමාජිකයන් සංඛ්‍යාව පදනම් කරමින් සමෘද්ධි සහනාධාර මුද්දර ලබාදිය යුතු වුවද, එයට පටහැනිව සමෘද්ධි බැංකු 10 ක් විසින් පවුල් 43 සඳහා වැඩිපුර ගෙවා තිබූ රු.2,993,215 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමෘද්ධි ප්‍රතිලාභීන්ට වැඩියෙන් ලබාදුන් සහනාධාර මුදල කොටස් වශයෙන් අය කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛයට පටහැනිව සිදුකරන ලද වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උහන ප්‍රදේශයේ සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2020 පෙබරවාරි 02 දින රු.4,026,559 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදී තිබුණ නමුත්, මෙම ඉදිකිරීමට අදාල ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා මෙම ප්‍රතිපාදන ආපසු හරවා යවා ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. | කොවඩ් - 19 ව්‍යාප්ත වීම හේතුවෙන් කාර්යාල ක්‍රියාවලියන් මන්දගාමී තත්ත්වයක පැවති නිසා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ප්‍රතිපාදන ලැබී ඇති ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදුකිරීමට පියවර ගත යුතුය. |
| (ආ) සමන්තුරේ සහ නාවිදන්වෙලි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාර්ග ප්‍රතිසංස්කරණ සහ විදුලිය සම්බන්ධතාවන් සඳහා ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ රු.250,000 ක මූල්‍ය ප්‍රතාපාදන සලසා තිබුණත්, ශක්‍යතා අධ්‍යයන වාර්තා සහ තක්සේරු වාර්තා නියමිත කාල වකවානු තුළ ඉදිරිපත් නොකිරීම නිසා මෙම ව්‍යාපෘති අතහැර දමා තිබුණි. | වාර්තාවන් නිසි කාලය තුළ ඉදිරිපත් නොකිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමට පියවර ගෙන ඇති අතර ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | සක්‍යතා වාර්තා හා ඇස්තමේන්තු වාර්තා නිසි කාලය තුළ ඉදිරිපත් කර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) කල්මුනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි කාර්මෙල් පාතිමා ජාතික පාසලේ ශ්‍රහස්ථ මණ්ඩපය ඉදිකිරීම සඳහා ආර්ථික සවිබල ගැන්වීම සහ සමාජ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ දී රු.1,000,000 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදී තිබූ නමුත් මෙම ව්‍යාපෘතිය අදාල කාලපරිච්ඡේදයේදී ආරම්භ නොකර අතහැර දමා තිබුණි. | මෙම ව්‍යාපෘතිය 2020 වර්ෂයේ අවිච්ඡේද වැඩසටහන් යටතේ ඇතුලත් කිරීම සඳහා අනුමැතිය හා අදාළ මුදල නිදහස් කරන ලෙස ඉල්ලීම් කළ ද ඒ සඳහා අනුමැතිය නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අත්හැර දමා ඇත. | නියමිත කාලය තුල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

## 3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය විසින් මහඔය ප්‍රදේශයේ වැඩිහිටියන් රැකබලා ගැනීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ ගිවිසුම ප්‍රකාරව, එහි ඉදිකිරීම් කටයුතු 2020 අගෝස්තු 20 දින ආරම්භ වී 2020 ඔක්තෝබර් 13 දින අවසන් කළ යුතුව තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව රු.2,488,475 කට පුද්ගලික ආයතනයකට භාරදී තිබුණත්, 2021 අප්‍රේල් 21 දින වන විට රු.1,082,799 ක් හෙවත් සියයට 43 ක් වටිනා කාර්යයන් පමණක් නිමකර තිබුණි. | කොවිඩ් - 19 වසංගතය හා වෙනත් හේතූන් මත නියමිත කාල පරිච්ඡේදය තුළ වැඩ කටයුතු නිම කිරීමට නොහැකි වී ඇති අතර, නිම කරන ලද වැඩ වලට අදාළ රු.1,082,799 ක මුදලක් ගෙවීම් කර ඉතිරි මුදල තැන්පත් කරන ලදී. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය සම්පූර්ණ කළ යුතුය. |

## 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු වාහනයකට 2019 සහ 2020 වර්ෂ තුළ සිදුවූ අනතුරු 02 ක් වෙනුවෙන් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය නොකළ රු.635,325 ක් මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ සටහන (i) හි දක්වා නොතිබුණි. | මෙම වාහන අනතුර සඳහා පරීක්ෂණ සම්පූර්ණයෙන් අවසන් නොවූ නිසා වැරදි ලෙස පාඩු හා අත්හැර දැමීම පිළිබඳ ප්‍රකාශයේ ඒවා ඇතුළත් නොකර ඇත. නමුත් පරීක්ෂණ අවසන් නොවූ නමුත් ඒවා හානි ලෙස ඇතුළත් කළ යුතු බවට විෂය නිලධාරියාව දැනුවත් කර ඇත. | වාහන අනතුර මත ඇති වූ පාඩුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

**3.4** කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දීර්ඝකාලීන බදු පදනමින් ඉඩම් ලබාදීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් අයකළ යුතුව තිබූ හිඟ බදු රු.5,271,471 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ බදු තැන්පත්කරුවන්ගෙන් හිඟ මුදල අයකිරීමට උපදෙස් ලබා දී ඇත. | බදු ආදායම් කාලීනව අයකිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිවාස 6කින් අයකළ යුතු කුලී රු.338,531 ක් 2002 වර්ෂයේ සිට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂය රජයේ නිවාස 06කට අදාළ වන අතර මේවා අයකිරීමට පියවරගෙන ඇත. | රජයේ නිවාසවලින් අයවිය යුතු කුලී කඩිනමින් අය කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යලායට අයත් වාහනයකට සිදු වූ අනතුරක් සම්බන්ධයෙන් රක්ෂණ සංස්ථාවෙන් ලබා ගත හැකිව තිබූ රු.මිලියන 4.8 ක වාහන රක්සණ හිමිකම, නියමිත කාලවකවානුව තුළ ඉල්ලීම් නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | වන්දි ලබා ගැනිම සඳහා 2021.10.08 දිනැති අමාත්‍යාංශ අනුමැතිය ඉල්ලා ඇත. | රක්ෂණ සංස්ථාවෙන් ලබාගත හැකි වන්දි මුදල් කඩිනමින් ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| (ඈ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහනයක් වර්ෂ 20කට අධික කාලයක සිට අළුත්වැඩියා කිරීමට ගරාජයකට භාරදී තිබුණත්, එය ආපසු ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 42-8880 අංක දරන වාහනය නැවත මෙම කාර්යාලය වෙත රැගෙන ඒම සඳහා මෝටර් රථ පරීක්ෂකගේ වාර්තාවක් ඉල්ලා ඇත. | වාහනය අළුත්වැඩියා කර ධාවනයට යොදා ගත යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) පුරප්පාඩුව පවතින ග්‍රාමසේවක තනතුරු 76 ක් සඳහා ස්ථිර බඳවාගැනීම් සිදුනොකිරීම නිසා ග්‍රාම සේවක වසම්වල පරිපාලන කටයුතු මන්දගාමී තත්ත්වයක පැවතුණි. | ග්‍රාම නිලධාරී පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන සේවක පුරප්පාඩු පිරවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ අනුමත කාර්ය මණ්ඩලය 2,364ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 2,163ක් විය. එසේ වුවත්, පුරප්පාඩුව පවතින තනතුරු 201 ක් බඳවා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කර ඇත. | සේවා අවශ්‍යතා මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් පවතින පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය. |